**කැකිරාව ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරණ චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බොරළු මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබූ රු.23,689,384 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස නොසලකා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදමක් ලෙස හා පුනරාවර්තන ප්‍රදානයක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | සභාවට අයත් මාර්ග අළුත්වැඩියා කිරීමට මෙම වියදම් සිදුකර ඇති නිසා සභාවේ වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. | සභාව විසින් සිදුකළ වියදම් පමණක් ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ පරිසර බලපත්‍ර ආදායම් රු.260,000 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ආදායමක් ලෙසත් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ලැබිය යුතු ආදායමක් ලෙසත් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | වර්ෂයට අදාළ නිවැරදි ආදායම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඇ) | මහවැව පානීය ජල ව්‍යාපෘතිය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සහ පිරිපහදු යන්ත්‍රයක් මිලදී ගැනීමට 2019 වර්ෂයේදීද වැය කර තිබූ රු.1,725,178 ක් එම වර්ෂයේදී ණයගැතියන් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදීද නැවත වරක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් පමණක් ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ විනෝද බදු ආදායම රු.90,005 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.123,664 ක් ලෙස රු.33,659 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ආදායම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඉ) | ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා කැකිරාව කිරිහලෙන් ලැබිය යුතු කඩ කුලී ආදායම රු.36,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.15,000 ක් ලෙස රු.21,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | වර්ෂයට අදාළ නිවැරදි ආදායම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඊ) | ආදාහනාගාර ආදායම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ ආදාහනාගාර ආදායම රු.1,115,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,136,000 ක් ලෙස රු.21,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි දේවල් ඇති නොවීමට වගා බලා ගනිමි. | වර්ෂයට අදාළ නිවැරදි ආදායම ගිණුම්ගත කළයුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 28 දිනැති අංක NCP/LG/DE/04/04/ 2020 දරන ලිපිය | සභාවේ යන්ත්‍ර උපකරණ ණය පදනම මත කුලියට ලබාදීම නොකරන ලෙස උපදෙස් ලබාදී තිබියදී සභාවේ යන්ත්‍ර 04 ක් අවස්ථා 240 කදී ණය පදනම මත ලබාදීම නිසා ලැබිය යුතු යන්ත්‍ර කුලී ආදායම් රු.1,591,500 ක් අයවී නොතිබුණි. | පිළිගනිමි | වාහන කුලී ආදායම් අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 9,591,249 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,850,128 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

-----------------------

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.4,352,289 ක හිඟ වරිපනම් අයකර ගෙන නොතිබුණි. | පිළිගනිමි | හිඟ වරිපනම් අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |
| **(ආ) කුලී** | | |
| 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කඩකුලී රු.4,409,072 ක් අයකර ගෙන නොතිබුණි. | මෙම කුලී අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කරමි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ක්‍රියාකර අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

**3.1** **හඳුනාගත් පාඩු**

-------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කැකිරාව නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේදී සභාවට අයත් විදුලි මීටරය කොන්ත්‍රාත්කරු විසින් භාවිතා කිරීම නිසා 2020 ජුනි 20 දිනට ලැබිය යුතු රු.119,009 ක විදුලි බිල නාගරික සංවර්ධන අධිකාරිය (කොන්ත්‍රාත්කරු) මගින් ප්‍රතිපූර්ණය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | විදුලි බිල ප්‍රතිපූර්ණය කර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |
| (ආ) | ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ලංසු දැන්වීම් පල කිරීමේදී අවස්ථා දෙකකදී පුවත්පත් දැන්වීම පලකිරීම නිසා සභාවට රු.95,472 ක අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි. | පිළිගනිමි | පුවත්පත් දැන්වීම් පල කිරීම සඳහා භාරදීමට පෙර අවශ්‍යතාවය නිවැරදිව තහවුරු කර ගත යුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ පිහිටි කඩ කාමර 05 ක් වසරක් ඉක්මවූ කාලසීමාවක් තුළ අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වසා දැමීම නිසා 2020 නොවැම්බර් 30 දින වනවිට සභාවට රු.379,500 ක ආදායමක් අහිමිවී තිබුණි. | පිළිගනිමි | කඩ කාමර අළුත්වැඩියා කර ආදායම් උත්පාදනය කර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |
| (ආ) | වසර 03 කට අධික කාලයක සිට රාජ්‍ය බැංකු ජංගම ගිණුමේ (පුරනැඟුම) රු.5,752,291 ක මුදලක් නිශ්කාර්යව පැවතුණි. | පිළිගනිමි | ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කිරීමට ක්‍රියාකළයුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 02 ක් ඉක්මවූ රු.1,071,532 ක බදුකුලී ආදායම් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | පිළිගනිමි | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඈ) | 2016 වර්ෂයේදී ලැබුණු රු.1,000,000 ක ප්‍රතිපාදන වලින් ඍජු ශ්‍රමය යටතේ ආරම්භ කළ කැකිරාව ආයුර්වේද ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.767,969 ක් වැයකර තිබුණු නමුත් 2021 පෙබරවාරි 28 දින වනවිටත් බිත්ති තීන්ත ආලේප කිරීම, නාන කාමරය ස්ථාපිත කිරීම, විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම හා සැපයුම ලබාදීම, ජල සැපයුම ලබාදීම, ඇලුමිනියම් ජනෙල් හා PVC දොරවල් සවිකිරීම ඇතුළත් රු.430,068 ක වැඩ කොටස් ඉටුකර නොතිබුණි. | පිළිගනිමි | ඉදිකිරීම් ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |